**THE JOURNAL OF LANGUAGE AND CULTURE**

Volume 2 - Issue I
October-November 2024

**T J O L C**
**ISSN 2806-5395**

**Category: Research Article**

# උවෘ පළාතේ දේව ඇදහිල්ල හා ශාන්තිකර්ම පද්ධතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**හර්ෂණී මිල්ලගහතැන්න**

**ARTICLE DETAILS**

Published Online & Printed
October-November 2024

***Author:***

**Harshani Millagahathenna**
***Senior Lecturer***
Department of Languages
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka
Mihinthale
**Email:** *harshimtc2010@yahoo.com*

***Keywords***:
religious ethos, belief systems. spiritual framework, analytical exploration

## Abstract

The politico-historical background of the Uva Province has played a significant role in shaping its religious ethos. The religious framework of Uva is complex and deeply rooted in Buddhist traditions. The residents of the province adhere to a belief system that integrates Buddhist deities and veneration of demons, reflecting a blend of spiritual devotion and pragmatic aspirations.With the advent of Buddhism in ancient Sri Lanka, it is plausible to assert that the indigenous demon-related beliefs—centered on raakshas and yakshas—were assimilated and transformed within a Buddhist cultural and spiritual framework. As a profoundly spiritual tradition, Buddhism influenced the integration of local religious practices, with rural communities adapting these syncretic belief systems to address their material desires and everyday concerns. This study aims to undertake an analytical exploration of the traditional belief systems and worship practices unique to Uva. Additionally, it seeks to examine the underlying motivations for these practices and evaluate whether these belief systems have yielded beneficial outcomes for the local population.

ඌවේ ඓතිහාසික හා දේශපාලන පසුබිම එහි ආගමික පසුබිම නිර්මාණය වීම කෙරෙහි ද ඍජුව හා වක්‍රව බලපා තිබේ. බුදුදහමට අනුගත වූ ඇදහිලි විශ්වාස පද්ධතියකින් සමන්විත ඌවේ ආගමික පසුබිම සංකීර්ණ වූවකි. ඌවේ වැසියෝ බුදුදහම ප්‍රමුඛ කොටගත් දෙවි දේවතාවන් හා යක්ෂයන් විෂයෙහි පුද පූජා පිළිවෙත් සිදුකොට ලෞකික ජීවන අපේක්ෂා මුදුන්පමුණුවා ගනිති.

බුදුන් වහන්සේගේ ලංකාගමනයෙන් එතෙක් පැවති රාක්ෂස හා යක්ෂ ඇදහිලි විශ්වාස පද්ධතිය බෞද්ධාගමික පරිසරයකට අනුව වෙනස් වූ බව සිතිය හැකිය. බුදුදහම වූ කලී ලෝකෝත්තර පක්ෂය හා තදනුබද්ධ හෙයින් ලෞකික සුභසෙත සඳහා ගැමි ආගම යොදා ගැනීමට තත් ප්‍රදේශයේ වැසියන් උත්සුක වූ බව පෙනේ. උක්ත පර්යේෂණාත්මක අධ්‍යයනය මගින් අපේක්ෂා කරන්නේ ඌවට විශේෂිත වූ දේව ඇදහිලි හා පුද පූජා ශාන්තිකර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමත් එවැනි පුදපූජා හා ඇදහිලි පද්ධතියක් ඇතිවීම කෙරෙහි බලපෑ පසුබිම විමර්ශනය කරමින් ඉන් තත් ප්‍රදේශාශ්‍රිත ජනතාවට කිසියම් වූ සාධනීය ඵල උදාකර තිබේද යන්නත් විමසීමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී දත්ත රැස්කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනේ. එහිදී මූලික වශයෙන් දත්ත රැස්කිරීමට අපේක්ෂා කෙරෙන්නේ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හා ප්‍රාථමික මූලාශයශ්‍ර අධ්‍යයනයෙනි. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සහභාගීත්ව නිරීක්ෂණයත්, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයත්, යොදා ගැනේ. මූලාශ්‍රයය අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයය භාවිතය සිදු කෙරුණි.

## පර්යේෂණ ගැටලුව

ඌව පළාතේ දක්නට ලැබෙන දේව ඇදහිලි හා ශාන්තිකර්මයන්හි බලපෑමෙන්, තත් පෙදෙස් වැසියන්ගේ රෝගව්‍යාපසමනය හා භෞතික සුභසිද්ධිය ඇති කිරීමට සමත් ගුප්ත විද්‍යාත්මක යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේද යන්න උක්ත ඇදහිලි හා ශාන්තිකර්මයන්ගේ භාවිතය කෙතරම් දුරට යෝග්‍යද යන්න මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලු වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### ඌවේ දේව ඇදහිලි

ඌවේ දේව ඇදහිලි පද්ධතිය සංකීර්ණ ස්වභාවයක් උසුලයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවතෙන ප්‍රබල දේව සංකල්ප දෙකක් (කතරගම දෙවියන් හා සමන් දෙවියන්)ඌවේ ව්‍යාප්ත වීම ඊට ප්‍රධාන හේතුවකි. එසේම භාරතීය පත්තිනි දේව ඇදහිල්ල ඌවේදී යක්ෂ ගෝත්‍රික(වැදි) සංකල්ප සමඟ මිශ්‍ර වී කිරිඅම්මා දේව ඇදහිල්ල හා බද්ධවනු දැකිය හැකිය. එපමණක් නොව, ඌවේ ඇතිවූ දේශපාලනික හා ඓතිහාසික සංසිද්ධි ඔස්සේ යුද්ධයෙහි

හසළ ප්‍රවීණතාවක් ප්‍රකට කොට මරණින් පසු බණ්ඩාර දේව සංකල්පය යටතේ ස්ථාපිත වී ඌවේ ජනතා ගෞරවයටත් වන්දනමානයටත් ලක්වන පිරිසක් ද වේ. ඒ හා බද්ධ වූ ශාන්තිකර්ම රැසක්ද ඌවේ දැකිය හැකිය. එකී දේව සංකල්ප පිළිබඳ විමර්ශනය කිරීම මෙහිදී සිදුකෙරේ.

## ඌවේ ප්‍රධාන දේව ඇදහිලි

ඌවේ ප්‍රධාන දේව ඇදහිලි කිහිපයක් දැකිය හැකිය. එනම් කතරගම, සමන්, උපුල්වන්, විෂ්ණු හා පත්තිනි දේව ඇදහිල්ලයි.

## කතරගම දේවියෝ

කතරගම දේව ඇදහිල්ල ඌවේ ප්‍රබල දේව විශ්වාසයකි. බුදුන්වහන්සේගේ ලංකාග මනට පූර්වයෙහි තාරක නම් අසුර රජු මරණයට පත් කර, පහළ ඌවේ කතරගම වාසය කළ කඳකුමරු හෙවත් මහසෙන් දෙවි (පියනන්ද හිමි, 1954: 194-198) නමින් ප්‍රකට කතරගම දෙවියන් ඌවේ වන්දනාමානයට පාත්‍ර වන පැරණිම දෙවියා වශයෙන් සැලකේ. මෙකී මහසෙන් දෙවියන් යක්ෂ ගෝත්‍රික වල්ලි අම්මා විවාහකර ගත් බවට පවතින ජනප්‍රවාදයෙන් සනාථ වන්නේ උක්ත දේව වන්දනයට දේශීය ජනතාව නැඹුරු වූ ආකාරයයි.

කතරගම දෙවියන්ගේ ප්‍රධාන දේවාලය පහළ ඌවේ පිහිටා තිබේ. ඌවේ අනෙකුත් ප්‍රදේශ රැසකම කතරගම දෙවියන් උදෙසා ඉදිකෙරුණු ඉපැරණි දේවාල කිහිපයක් වේ. සොරගුණේ(බණ්ඩාර,1993:51-54; සන්නස්ගල,1973; ධම්මානන්ද හිමි,1966:156), කොටබෝව හා බදුල්ලෙහි (ධම්මානන්ද හිමි,1966:145) එම දේවාල වේ. ඌව පැලවත්තේ පුරාණ දේවගිරි රජමහා විහාරයේ මහසෙන් දේවාලයක් පිහිටා ඇත. මොණරාගල පොකුණුගල පුරාණ විහාරයේද කතරගම් දේවාලයක් වේ(බණ්ඩාර,1995: 36).

ඌවේ සමන් දේව ඇදහිල්ල ඉතා පැරණි වූවකි. බුදුන්වහන්සේගේ ප්‍රථම ලංකා ගමනේදී බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය ශ්‍රවණය කළ සුමන දෙවියන් සෝවාන් වී බුදුන්වහන්සේගේ කේශධාතු මිටක් නිධන් කර සත්රියන් උසැති ඉඳුනිල්මිණි දාගැබක් නිර්මාණය කළේය. (මහාවංසය,1959: 1 පරි,33-36). මෙකී සංසිද්ධියත් සමඟ සමන් දෙවියෝ ඌව ප්‍රමුඛ ලක්දිව උත්කෘෂ්ට ඇගයුමට පාත්‍ර වන්නට වූහ. මේ නිසාම ඌවේ ප්‍රධාන දේව වන්දනයක් ලෙසට සමන් දෙවියන් පිදීමත් දේවාල ඉදිකිරීමත් සිදු වූ බව සිතිය හැකිය. මහියංගණ සැරද භූමියේ අතීතයේ සිට පැවති සුමන සමන් දෙවියන්ගේ දේවාලයක්ද පැවතීමෙන් මේ බව වඩාත් තහවුරු වේ (ධම්මානන්ද හිමි, 1966:177).

යථෝක්ත සුමන දෙවියන් ප්‍රාග් බෞද්ධ යුගයට අයත් වූවෙකු බව පෙන්වන වල්පොළ රාහුල හිමියෝ, සුමන දෙවියන් බුදුන් ලක්දිවට වැඩි පළමු අවස්ථාවේ බුදුන් සරණ ගිය යක්ෂයෙකු විය හැකි යැයි ප්‍රකාශ කරති(ඎයමක්ල1966ඵ41). ප්‍රාග් බෞද්ධ

යුගයේ දෙවියකු වූ යම දෙවියන් සමන් දෙවියන් බවට පත්වූ බව පරණවිතානයන්ගේ විශ්වාසයයි(ඡ්රබ්ඩසඑය්බ්ල1953).

කෙසේ වුවත් සුමන සමන් දෙවියන් බුදුන්වහන්සේ වැඩම කළ දිනයේ පටන් ඌවේ බොදු ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූවා නියතය.

බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩම කළ සමයේ පණීත මහා රජු රාජ්‍යය පාලනය කළ බවත් සමනල කඳු මුදුනේ සිටි සුමන (සමන්)පණිත රජුගේ භාණ්ඩාගාරික බවත් කියැවෙන ලිපි ලංකාවේ ඇති බව සූරිය ගුණසේකර ප්‍රකාශ කරයි(ගුණසේකර,2007:113).එහෙත් ඒ පිළිබඳව තවදුරටත් විමසිය යුතුව ඇත.

## උපුල්වන් දෙවියෝ

ඌවේ උපුල්වන් දේව වන්දනයද පැවති බවට සාධක පවතී. බුදුන් වහන්සේ පිරිනිවන් පෑ දිනයේ විජයාදීන් ලක්දිවට ගොඩ බසිද්දී ඔවුන්ගේ ආරක්ෂාවට උපුල්වන් දෙවියන් පැමිණි බව විශ්වාසයක් පවතී(මහාවංසය,1959: 7 පරි, 1-9 ගාථා). ක්‍රි. ව. 7වන සියවසෙදී රෝහණ රාජ්‍යයේ සිටි දප්පුල රජු "කිහිරැලි වෙහෙර කොට දෙවියන් පිදී" යැයි මහාවංශයේ සඳහන් වේ(මහාවංසය,1959: 44 පරි, 155 ගාථාව). මින් අදහස් වන්නේ උපුල්වන් දෙවියන් බව පරණවිතානයන්ගේ අදහසයි(ඡ්රබ්අසඑය්බ්ල1953ත1). බෞද්ධ භාවයට පත් උදකපාල වරුණ හෙවත් උත්පලවර්ණ වූ කලී ප්‍රාග් බෞද්ධයන් ඇදහූ වරුණ දෙවි බව පරණවිතාන පෙන්වා දෙයි(ඡ්රබ්අසඑය්බ්ල1953ත25). ඓතිහාසික යුගයේදී ඌවේ ජනතාව රාජ්‍ය අනුග්‍රහය සහිතව උපුල්වන් දේව වන්දනය සිදුකළ බව මෙයින් තහවුරු වේ.

## විෂ්ණු දෙවියෝ

විෂ්ණු දේව වන්දනයද ඌවේ ප්‍රචලිත වූවකි. ඌවේ රිල්පොල ගොඩේගෙදර රජමහා විහාරය ආශ්‍රිතව ඇති ඉපැරණි විෂ්ණු දේවාලය විශේෂ එකකි. කන්දගෙදර තැන්නෙ පංගුව වලව්ගොඩ රජමහා විහාරයෙහි මහනුවර යුගයට අයත් විෂ්ණු දේවාලයක් පවතී. දේවාල ගොඩැල්ල නමින් මෙය ප්‍රසිද්ධව ඇත (බණ්ඩාර,1995: 36).

සිංහල රාජධානිය අනුරපුර පිහිටුවා වසර දහසක් පමණ ගතවන තෙක්ම උපුල්වන්, සමන් හා කඳකුමරු යන දෙවියන් ත්‍රිත්වය ගැන පමණක් මහාවංසයේ අවධානය යොමුව පැවතීම විශේෂත්වයකි. එහිදීද සමන් හා කඳකුමරු ඌවට ප්‍රධාන සම්බන්ධයක් දක්වයි. (ධර්මදාස සහ තුන්දෙණිය,1994:16).

## පත්තිනි දෙවියෝ

ඌවේ පත්තිනි දේව ඇදහිල්ල ඉතා ප්‍රකට වූවකි. භාරතීය පත්තිනි දේව ඇදහිල්ල ඌව ප්‍රදේශයට පැමිණීම සිදුවන්නේ ගජබාහු රාජ්‍ය සමයේදීය(සීලප්පදිකාරම් දෙමළ මහා

කාව්‍ය,1996). ඔහු පත්තිනි දේවියගේ සළඹ සමඟ දොළොස්දහසක් සොළීන් මෙරටට රැගෙනවිත් (චන්ද්‍රජෝති හිමි,1954:55-79; පූජාවලිය,1997:726) පදිංචි කරවූ ප්‍රදේශ අතර ඌව ද ප්‍රමුඛස්ථානයක් ගැනීම ඊට සාක්ෂියකි(අභයවර්ධන,1978:140).

පූර්වෝක්ත සාධක අනුව මෙම යුගයේදී ඌවේද පත්තිනි ඇදහීම ආරම්භ වූවා යැයි සිතිය හැකිය. පතිව්‍රතාව රැකීමේ පරමාදර්ශයක් සේ සලකා පත්තිනි දේවිය වන්දනා කර, දරුඵල ලබාගැනීම හා පැපොල, සරම්ප වැනි බෝවන රෝග දුරුකිරීම උදෙසා පුද පූජා පැවැත්වීමට ඌවේ වැසියෝ පුරුදු වී සිටිති.

පත්තිනි දේවිය උදෙසා සිදුකෙරෙන පූජාකර්ම අතර අංකෙළිය ඌවේ අතිශයින් ජනප්‍රිය වූවකි. ඌවේ පිහිටි ප්‍රධාන පත්තිනි දේවාල කිහිපයකි. ඒ අතර කුඹල්වෙල (ධම්මානන්ද හිමි,1966:140) බදුල්ල, බදුල්ල ලිඳමුල්ල, පුස්වැල, (බණ්ඩාර,1995:37) හල්පේ, පත්තිනි දේවාල සේම මොණරාගල මඩුල්ලේ මකුල්ල, ඉහළ ඌවේ කොටවෙහෙර, පහළගම පුරාණ ථූපාරාම රජමහාවිහාරය අසල ගජබා යුගයට අයත් පත්තිනි දේවාලය, දඹවින්න වැරැල්ලපතන, නාවෙල, කැප්පෙට්ටිපොළ විදුරුපොළ මැණික්බණ්ඩාර දේවාලය අසල පත්තිනි දේවාලය, (බණ්ඩාර,1995: 37) සොරණාතොට කොහොවිල පත්තිනි දේවාලය (මඟ සලකුණ,1947) ආදිය ඌවේ ඇති පැරණි පත්තිනි දේවාල වේ.

මෙම දේවාල බොහොමයක පත්තිනි දේවිය අරබයා දෛනික හා වාර්ෂිකව පෙරහැර, දියකැපීම, දිව්රීම, අළුත් සහල් මංගල්ලය, ගම්මඩු නැටීම, මල්එළිය නැටීම ආදි සුවිශේෂ පූජාකර්ම ඌවේ ජනතාව සිදුකරයි (බණ්ඩාර,1995:37). අම්පිටිය ශ්‍රී අභිනවාරාමයේ පිහිටි පත්තිනි දෙවොලෙහි අංකෙළිය අතීතයේ සිට පැවතියකි. ඌවේ අම්පිටිය නාමය ස්ථාන රැසක ඇති හෙයින් පත්තිනි ඇදහීමේ ප්‍රබලත්වය ඉන් පැහැදිලි වේ.

## අවශේෂ දේව සංකල්ප

ඉහත දැක්වූ ප්‍රධාන දෙවි දේවතාවන්ට අමතරව මෛත්‍රී නාථ, වෙසමුණි, වල්ලිමාතා හා ගණදෙවි ආදී වූ දේව සංකල්ප රැසක්ද ඌවේ පැවැති බවට සාධක ලැබේ. ඌවේ පැරණි විහාරස්ථාන බොහොමයක මෙකී දේව රූප සිතුවම් කර ඇතිවා සේම එක් එක් දෙවියන් උදෙසා වෙන වෙනම දේවාල ඉදිකර තිබීමද දක්නට ලැබේ(බණ්ඩාර,1995:37*ග ඌවේ සන්නස් හා තුඩපත්වල ද මේ තොරතුරු ඇතුළත් වේ. ඒ අනුව උළුගල සන්නස, පස්සර බෝගොඩ විහාර සන්නස, බෝගන්දන සන්නස හා සොරගුණේ දේවාල තුඩපතට අනුව මෛත්‍රී නාථ, උත්පලවරුණ, කිහිරැලි, උපුල්වන්, සමන්, බොක්සැල්, විභීෂණ, වෙසමුණි, කන්ද කුමාර, වල්ලිහාමි, ගණදෙවි හා මංගර දේව වන්දනයද තත් ප්‍රදේශාශ්‍රිතව පැවතී ඇත(ධම්මානන්ද හිමි,1966: 219,220,223,224,241).

යථෝක්ත සන්නස් හා තුඩපත්වල සඳහන් තොරතුරු අනුව ඌවේ පැරණි විහාරගේ හා ලෙන්වල දේවරූප සිත්තම්කර කර තිබූ අතර ප්‍රධාන දේවාලයක වුවද ප්‍රධාන දේව

ප්‍රතිමාවට අමතරව අනෙකුත් දෙවියන්ගේ ද ප්‍රතිමා සහ සිතුවම් නිර්මාණය කර තිබුණි. ඉංග්‍රීසි යුගයේදී ඌවේ සෑම විහාරස්ථානයකම දේවාලයක් වූ බව හර්බට් වයිට් පෙන්වා දෙයි ːඋයසඑැල1985* .

ඌවේ යථෝක්ත දේව විශ්වාස පැවතුණ ද ආර්ය දේව සංකල්පයට වෙනස් මුහුණුවරකින් එය ක්‍රියාත්මක වූවාට සැක නැත. ඊට හේතු වන්නේ බොහෝ දෙවිවරුන් ලාංකේය දේව මණ්ඩලයට ඇතුළත් කර බෞද්ධාගමික මුහුණුවරක් ආරෝපණය කර තිබීමයි. එහිදී යහගුණ සපිරි සම්‍යක්දෘෂ්ටික දෙවියන් රැසක් බෞද්ධයන් අතර ජනප්‍රිය විය. විෂ්ණු හා සමන් දෙවිවරු සෝවාන් වූවෝ වෙති. පත්තිනි මතු භවයක පිරිමි ජන්මය ලබා බුදු බවට පත් වේ. කතරගම දෙවියන්ද බෞද්ධයෙකි (ධ\ඹිැන්ර්ල1984ඵ65-66). කෙසේ වුවද වීදාගම හිමි විසින් රචිත හංස සංදේශයෙහි උපුල්වන්, සමන්, කාර්තිකේය හා විභීෂණ බුදුන්වහන්සේගේ සුවච කීකරු අන්තේවාසිකයින් බවට පත්වී ඇත(හංස සංදේශය,1964ඃ 198-199 පද්‍ය).

කෝට්ටේ යුගයේදී උපුල්වන් දෙවියන් කේන්ද්‍රීයව සමන් බොක්සැල්, කාර්තිකේය හා විභීෂණ යන සිව් දෙනා ලංකාවාසීන්ගේ පුද පූජාවන්ට පාත්‍ර වූ ප්‍රධාන දෙවිවරුන් බවට පත් වූහ(ධර්මදාස සහ තුන්දෙණිය,1994:21). යථෝක්ත දෙවිවරුන් සතරදෙනා අතුරින් උපුල්වන් දෙවියන් හැර ඉතිරි දෙවිවරුන් තිදෙනාගේම සම්භවය ඌවේ සිදුවීම විශේෂත්වයකි.

## ඌවට ආවේණික විශේෂ දේව මණ්ඩලය

පූර්වෝක්ත දේව විශ්වාසයන්ට අමතරව ඌවට ආවේණික වූ උපදේව කොට්ඨාසයක් ඌව ජනතාවගේ ලෞකික සුභසිද්ධිය උදෙසා වන්දනාවට පාත්‍රව සිටී. මෙම උපදේව ගණයෙහි ඇතැම් දෙවිවරු උසස් දේව කුලයේ සහායකයන් හෝ නියෝජිත සේවකයන් ලෙස ක්‍රියා කරති. සද්ගුණ හෝ දුර්ගුණ නොවන මධ්‍යම පාන්තික ලක්ෂණ පෙන්නුම් කරන තවත් දේව කොටසක් ද වන අතර ක්‍රියාවෙන් යක්, බූ, පිසස් ආදීන්ට සමාන වුවත් උත්පත්තියෙන් දේවගණයට වැටෙන පහත් පෙළේ උපදේව ගණයක්ද වේ.

## ඌවේ බණ්ඩාර දෙවිවරු

බණ්ඩාර දේව සංකල්පයේ ඉතිහාසය දකුණු ඉන්දීය ද්‍රවිඩ මලලයන් (කරුණානන්ද,1990) හා දකුණු ඉන්දීයාවෙන් පැමිණි “පන්තාරම්” නම් වෙල්ලාල වංශික පූජක පිරිස් හා සම්බන්ධ වූවකි. (ෘඩ්ර්ව්ල1972ඵ47-68). එමෙන්ම දකුණු ඉන්දීය ග්‍රාමදේවතා සංකල්පය හා මෙරට බණ්ඩාර දේව සංකල්පය සමානත්වයක් දරන බවද කිවයුතුය(ධර්මදාස සහ තුන්දෙණිය,1994ඃ52). බණ්ඩාර දෙවිවරුන් ගැන චිර ප්‍රසිද්ධියක් ලබා ඇත්තේ වයඹ පළාතේ වුවද අනෙකුත් බොහොමයක් පළාත්වල ද මෙම දේව සංකල්පය ක්‍රියාත්මක වේ (වාචිස්සර හිමි,1964ඃ47-48).

ඌවේ ක්‍රියාත්මක උප දේව සංකල්ප අතර බණ්ඩාර දේව ඇදහිල්ල ඉතා සංකීර්ණ ස්වභාවයක් පෙන්නුම් කරන්නකි. ග්‍රාමාශ්‍රිතව ක්‍රියාත්මක වූ ප්‍රබල දේව ඇදහිල්ලක් වූ මෙය පාරම්පරික කපුවරුන් විසින් සිදු කෙරේ. මියගිය ජන ප්‍රධානීහු බණ්ඩාර දේව සංකල්පයට අයත් වෙති. මානව සමාජයේ දූරාතීතයේ සිට පැවති මියගිය මුතුන් මිත්තන් පිදීමේ චාරිත්‍රයට තත් දේව කොට්ඨාසය අනුගතයැයි කිවහැකිය. සමාජයෙහි කිසියම් සාධනීය හෝ නිෂේධනිය කරුණක් මූලික වී ප්‍රබල ස්මරණයක් රැඳවූ පුද්ගලයෝ මෙසේ දේවත්වයට පත්ව බණ්ඩාර දෙවිවරුන් නමින් ප්‍රකට වූහ. ඒ අනුව ඌවේ බණ්ඩාර දෙවිවරුන් බොහොමයක් උඩරට කැරැල්ලෙන් මියගිය නායකයන් බවත් නොයෙකුත් දේශපාලනික හේතු මත මියගිය පුද්ගලයන් බවත් පැහැදිලිව පෙනෙන්නකි.

ඌවේ ප්‍රධාන බණ්ඩාර දෙවිවරු අතර පඟුරේ බණ්ඩාර, කොටබෝවේ රාජකුමාර බණ්ඩාර, මොණරවාන රන්කීර්ති බණ්ඩාර, එක්කස්සේ රන් කීර්ති බණ්ඩාර, අළුගොල්ලේ දිවැස් දෙවි, කිවුලේ ගෙදර දිසා බණ්ඩාර ආදී කිහිප දෙනෙක් වෙති. මොවුහු බොහොමයක් දේවත්වයට පත් ජනනායකයෝ වෙති. දැලීව ලොකු අළුත් බණ්ඩාර, මිගවත්ත පදිංචි අළුත් බණ්ඩාර දෙවි, සිල්පොළගම ගොඩේගෙදර දෙවි, පට්ටියේගෙදර කටුගහ බණ්ඩාර, කිවුලේ ගෙදර අලුත් දෙවි ආදීහු තවත් එවැනි බණ්ඩාර දෙවිවරු වෙති.

## දැලීව ලොකු බණ්ඩාර දෙවියෝ

දැලීව ලොකු අළුත් බණ්ඩාර වූ කලී දෙවන රාජසිංහ රජු මැරවීමට කුමන්ත්‍රණ කොට රාජ උදහසට බියෙන් පලාවිත් පසුව තත් ගම් පෙදෙස දියුණු කිරීමට කැප වූ ජනනායකයෙකි. මොහු මරණින් මතු දේවත්වයට පත්විය. මෙම දෙවියන් මූලික කරගනිමින් වාර්ෂික උත්සව, අළුත් සහල් මංගල්ල, නානුමුර මංගල්ල, දෙවියන් වැඩමවීම හා යැදීම, ප්‍රදේශයට සෙත්පතා කන්නලව් කිරීම, සුබනිමිති කීම, මුරුතැන් වැඩීම, දිය කැපීම ආදී වූ උත්සව රැසක් සිදුකර ආශිර්වාද ලැබීමට ඌව ප්‍රදේශවාසීහු පෙළගැසී සිටිති(බණ්ඩාර,1995:38).

## කිවුලේ ගෙදර දිවි බණ්ඩාර දෙවියෝ

ඌව වෙල්ලස්ස කැරැල්ලේ වීරයකු වූ කිවුලේගෙදර මොහොට්ටාලගේ පරපුරේ කිවුලේගෙදර දිවිබණ්ඩාර දේවත්වයෙන් පිදුම් ලබන දෙවියෙකි. ලෙඩදුක් දුරුකර ගැනීමටත්, ශස්‍ය සම්පත් ආරක්ෂා කරගැනීම හා වර්ධනය කරගැනීමටත්, මෙම දෙවියන් උදෙසා වසරක් පාසා කිරි ඉතිරුම් පූජාකර්ම සිදුකිරීමට ඌවේ ජනතාව පෙළඹී සිටී(ධම්මානන්ද හිමි,1966:180). ඌවේ ගලේ බණ්ඩාර, ගම්බාර හා කළු බණ්ඩාර ආදී දෙවිවරුන් විෂ්ණු, කතරගම, ගලේබණ්ඩාර, කොටබෝව රාජකුමාර බණ්ඩාර, පත්තිනි දේවිය ආදීන් සමඟ එකට පුද ලබන අවස්ථාද වේ. උඩුමකුල්ගොල්ල දේවාලය මෙකී සියලු දෙවිදේවතාවුන් පූජාවට ලක්වන ස්ථානයකි (බණ්ඩාර,1995: 39).

## කීර්ති බණ්ඩාර දෙවියෝ

කීර්ති බණ්ඩාර යනු රාජ උදහසට ලක්ව මරණින් මතු දේවත්වයට පත් වූවෙකි. ඔහු රන් කීර්තී බණ්ඩාර දෙවියන් නමින් හැඳින්වේ. ඌවේ "මල් එළිය පූජාව" මොහු පිදීම සඳහා පවත්වන්නකි. මෙය දකුණු පළාතේ කප් සිටුවීමේ ශාන්තිකර්මයට සමානත්වයක් දරයි. තොවිල් දිනයේ මිදුලේ මල් යහන් තනනු ලබන්නේ කීර්ති බණ්ඩාර දෙවියන් ප්‍රමුඛ කොහොඹ දෙවියන් හා දැඩිමුණ්ඩ දෙවියන් උදෙසාය. ස්නානය කොට පිරිසිදු වූ කපුරාල හවස් යාමයේ බෙරවයන්නන්ද සමඟ පෙරහැරින් පැමිණෙන්නේ දෙවියන්ගේ ආභරණද සහිතව ආරූඪයෙනි. දේවාල භූමියට පිවිසෙන කපුරාල දේවපූජාව පවත්වා ආරූඪයෙන් පේන කියන්නට පටන් ගනී.

## ඌවේ බණ්ඩාර දෙවිවරු පස්දෙනා

දෙවන රාජසිංහ රජුගේ පුතුන් පස්දෙනා ඌවේ බණ්ඩාර දෙවිවරු පස් දෙනා නමින් පිදුම් ලබයි.

1. ඉහළ වළව්වේ අලුත් දෙවි
2. පහළ වළව්වේ දෙවි
3. දිසාබණ්ඩාර දෙවි
4. පටබැඳි අළුත් දෙවි
5. කඩවත දෙවි; එකී පස් දේවතාවෝ වෙති(හේරත් සහ තවත් අය,1991:361).

## ඌවේ දෙවි පස්කට්ටුව

ඌවේ දෙවිපස් කට්ටුව නමින් වූ තවත් බණ්ඩාර දෙවිවරු පස්දෙනෙක් පුද පූජාවට පාත්‍ර වෙති.

1. මුරුගල් බණ්ඩාර

4. වාහල් බණ්ඩාර

2. පළුගල් බණ්ඩාර

5. කළුබණ්ඩාර(ධර්මදාස සහ තුන්දෙණිය,1994:158).

3. කළුගල් බණ්ඩාර

## ඌවේ බණ්ඩාර දේව හත් කට්ටුව

ඌවේ බණ්ඩාර හත් කට්ටුවක් ද ඇත. ඒ පහත පරිදිය;

1. ඉරුගල් බණ්ඩාර
2. කළුවැදි බණ්ඩාර
3. අකරමග බණ්ඩාර
4. කීර්ති බණ්ඩාර
5. පිච්චමල් බණ්ඩාර
6. මැණික් බණ්ඩාර
7. ඌවේ බණ්ඩාර (දැඩිමුණ්ඩ)

(මීගස්කුඹුර,1991:40). මෙම දෙවිවරුන් උදෙසා වූ දේවාල මාදෝවිට, විදුරුපොල, කොටවෙර, තිරිවාන ගම හා බලගල ආදී ප්‍රදේශවල පිහිටා ඇත(ධම්මානන්ද හිමි,1966:136).

## ඌවේ ගම්භාර දෙවිවරු

ඌවේ ගම්භාර දෙව්වරුන් රැසකි. මෙම දෙවිවරුන්ද බණ්ඩාර දෙවිවරුන්ම බව පැහැදිලිය. ඒ මෙසේය;

1. අප්පුහාමි දෙවි
2. කටුගහබණ්ඩාර දෙවි
3. කළු බණ්ඩාර දෙවි
4. කැලේ බණ්ඩාර දෙවි
5. ගගේ බණ්ඩාර දෙවි
6. ගොඩේ ගෙදර දෙවි
7. දැලිවේ අලුත් බණ්ඩාර දෙවි
8. නිකවැරටියේ බණ්ඩාර දෙවි
9. බෝවල අලුත් දෙවි
10. මින්නේරියේ දෙවි

11. ලොකු බණ්ඩාර දෙවි

12. වන්නියේ බණ්ඩාර දෙවි

13. සාමාපොළ අලුත් බණ්ඩාර දෙවි(ධර්මදාස සහ තුන්දෙණිය,1994:157).

මෙම දෙවිවරුන්ගේ දේවාල ඌවේ ගම්බදව හා විහාරානුබද්ධව පවතී.

## ඌවේ ප්‍රාදේශීය දෙවිවරු දොළොස් කට්ටුව

ඌවේ ප්‍රාදේශීය දෙවිවරුන් දොළොස් කට්ටුවකි. මෙම දෙවිවරුද බණ්ඩාර දේව ගණයට අයත් වෙති.

1. මැණික් බණ්ඩාර දෙවි.
2. කීර්ති බණ්ඩාර දෙවි
3. අළුගොල්ලේ දෙවි
4. හාන්තානේ දෙවි
5. කිවුලේ ගෙදර අළුත් දෙවි
6. පත්තිනි අම්මා දෙවි
7. කිරි අම්මා දෙවි
8. හඳුන් කුමාරි දෙවි
9. බින්තැන්නේ දෙවි
10. අළුත් නුවර දෙවි
11. වට කුමාර දෙවි
12. හැඩ කුමාර දෙවි වශයෙනි (පියසේන,1991:215-216).

ගොඩකුඹුරේ දේවාලයේ මෙම දෙවියන් 12 කට්ටුව වෙනුවෙන් වාර්ෂිකව පූජා මංගල්ල සිදු කෙරේ. දෙවිවරුන් 9 දෙනෙකු වෙනුවෙන් වෙන වෙනම දර්ශනීය නැටුම් ඉදිරිපත් කෙරෙන අතර සියලු දෙවියන් විෂයෙහි අඩුක්කු 12ක් පූජා කොට දානය කැප කරයි(පියසේන,1991:215-216). ඌවේ බණ්ඩාර දේව සංකල්පය හා බද්ධ වූ දේවිවරුන්

සංඛ්‍යාත්මක වශයෙන් විමසීමේදී ගැටලු සහගත තත්ත්වයක් පෙන්වන බව ඉහත විග්‍රහයේදී දක්නට ලැබේ.

## වැදි ජනයාට ආවේණික නෑ යකුන් පිදීම හා ඌවේ බණ්ඩාර දේව සංකල්පය

තමන් අතර ජීවත්ව සිට මියගිය සියලු දෙනා නෑ යකුන් බවට පත්වේය යන්න වැදි ජනයාගේ විශ්වාසයයි(ැකසටප්බ 'බා ී ැකසටප්බල1911ඨ135). පෙර සඳහන් කළ පරිදි බණ්ඩාර දෙවිවරු වූ කලී සමාජයෙහි කිසියම් සාධනීය හෝ නිෂේධනිය කරුණක් මූලික වී ප්‍රබල ස්මරණයක් රඳවා මියගිය පුද්ගලයෝය. උක්ත බණ්ඩාර දෙවිවරුන්ගේ ප්‍රභවය වැදි ජනතාවගේ නෑ යකුන් පිදීමේ සංකල්පය සමඟද යම් සම්බන්ධතාවක් දක්වා ඇති නමුත් පසුකාලීනව තම ගම්වල නැසීගියවුන් සේම පිටරටින් පැමිණි ආගන්තුකයන්ද බණ්ඩාරදේව සංකල්පයට අන්තර්ග්‍රහණය කරගැනිණ (ධර්මදාස සහ තුන්දෙණිය,1994:48).

## ඌවේ කඩවර දේව සංකල්පය

කඩවර දේව සංකල්පය ඌවේ ප්‍රචලිත උපදේව ගණයකි. පහළ ඌවේ කතරගම දේවාලයේ දකුණු දොරටුව මුර කරන කඩවර දෙවියන් වූ කලී කඳසුරිඳුගේ සෙන්පති වූ බලවන්තයෙකි. ඒ බව කඩවර කෝල්මුර කවිවලින් අනාවරණය වේ;

කදිරපුරට පත් කන්දස්වාමිගේ දකුණු දොරටුවේ මුර කරමින්

ලකුණු ඇතිව ලේවාව තමන්කඩුව තඹගොමුව මින්නේරි රටින්

විහිදී දේව සැර ගිනිදැල් විලසට කෙළිපුද පූජා ගන්න උතුන්

කවර දේසෙක ගොස් වැඩසිටියත් වඩින්න කඩවර ස්වාමි උතුන්

තනන මැණික් රන්මාලද කවබඩ පැලඳ දිලෙයි ගතමුල සිනිඳු

මෙලක යකුන් හට අදිකාරන් පට ලැබුවා පෙර පින් කළ පුරුදු

මෙදක බලා මුළු දිෂ්ටි හෙළා ගෙන පේන කියා මුකයෙන් සිනිඳු

හනික වඩින වට උතුන් මෙ සිංහල සෙනෙවිරත්න කඩවර මැතිඳු (බණ්ඩාර,1995:41).

## කඩවර කළු බණ්ඩාර දෙවියෝ

ඌවේ ජනයා කඩවර කළු බණ්ඩාර දෙවියන් පිදීමෙන් බලාපොරොත්තු වන්නේ තම දෛනික ජීවිතයේ සුබිත මුදිත භාවයයි. කෘෂිකාර්මික දිවිපෙවෙතක් ගෙවන ඌවේ වැසියෝ අතීතයේ සිටම තම ගව මහීෂාදීන් රැක ගැනීමටත් ශස්‍ය භෝග උපද්‍රවයකින් තොරව නිසිකලට වර්ධනය කරගැනීමටත් ලෙඩදුක්, යක්ෂ හා භූත, ඇල්ම-බැල්ම දුරිභූත කර ගැනීමටත් මෙකී දෙවියන්ගේ පිහිට අපේක්ෂා කරති. උක්ත කඩවර කළු බණ්ඩාර දෙවියන්ගේ උපත්කතා තුළින් ඌවේ ජන අපේක්ෂා ඉෂ්ට සිද්ධ වීමට ඇවැසි පසුබිම සැකසී ඇති අයුරු මනාව විවරණය වේ. ඒ පහත පරිදිය;

සීතා දේවියගේ පපුව පලා උපන් කඩවර කළුබණ්ඩාර දෙවියන්ට ශක්‍ර දෙවියන් විසින් වී කරලක්, දුන්නක්, කෙටේරියක්, ඊයක්, හක්ගෙඩියක්, බණ්ඩාර දොළොස් කට්ටුවක්ද මවන ලදී. එසේම ඔවුන්ගේ ගේ දොර, වතුපිටි, රැකියා, ලෙඩදුක්, අපල උපද්‍රව, යක්ෂ-භූත බිය, දුරුකර ගැනීමට කඩවර 64 කට්ටුවක්ද ඔවුන්ගෙන් පසුව තුන්සිය දොළොස් කට්ටුවක පිරිවරක්ද මවන ලදී. මෙකී සඳහනින් අනාවරණය වන්නේ වී කරලින් ගොවිතැන් ද, දුනු, ඊ, කෙටේරියෙන් දඩයම හා වනගත පෙදෙසේ ආරක්ෂාව ද ස්ථාපිත කිරීමකි. හක්ගෙඩියෙන් සශ්‍රීකත්වය හා දේව බැල්ම සංකේතවත් වේ. මෙයින් පැහැදිලි වන්නේ ඌවේ වැසියන් අතර ගොවිතැනත් ජන ආගමත් ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක් අතීතයේ සිට ක්‍රියාත්මකවූ බවකි (බණ්ඩාර, 1995:40).

## ඌවේ ග්‍රාම දේවතා ඇදහිල්ල

ඌව ජනයාගේ ගරුබුහුමනට පාත්‍ර වන උපගණයේ දෙවිවරුන් ග්‍රාමදේවතාවන් යන විශේෂ නාමයෙන් ස.ජ. සුමනසේකර හඳුන්වයි. ඒ අනුව බණ්ඩාරවලියට අයත් දොළොස් කට්ටුවක් වූ දොළහ දෙවියන් හා කිරිඅම්මාවරුන් ඌවේ ග්‍රාම දේවතාවරුන් ලෙස ඔහු නම් කරයි. ඊට හේතු ලෙසට දක්වන්නේ මෙකී දෙවිවරු බොහොමයක් ග්‍රාමනාමවලින් හැඳින්වීමත් දේවතාවියන් අම්මා නමින් හැඳින්වීමත් ය. එය දකුණු ඉන්දීය ආභාසයෙන් පැනනැගුණක් විය හැකි බව ඔහු වැඩි දුරටත් පෙන්වා දෙයි(බණ්ඩාර, 1995: 38). උනාපාන කිරිඅම්මා ඌවේ වැසියන් හඳුන්වන ලෙසට කොල්ලාපූර් අම්මා යනු දකුණු ඉන්දීය දේවතාවියක් ග්‍රාමනාමයෙන්ම හඳින්වූ අවස්ථාවකි. ඉහළ පෙලේ දකුණු ඉන්දීය දේවග ණයක් වූ දුර්ගා දේවතාවිය දුර්ගම්මා ලෙසින් හඳුන්වන පරිදිම ඌවේදී පත්තිනි දේවිය පත්තිනි අම්මා නමින් හැඳින්වීම උක්ත අදහස සනාථ කිරීමකි(බණ්ඩාර, 1995: 38) .

## ඌවේ කිරි අම්මා ඇදහිල්ල

ඌවට ආවේණික විශේෂ උප දේව ගණයේ පහළ මට්ටමේ දේවතා විශේෂයක් සේ කිරි අම්මාවරුන් සැලකිය හැකිය. වැදි ජනයාට ආවේණික ඇදහීමක් වූ කිරි අම්මා දෙවිවරුන් හා කිරිදාන මංගල්ලය ඌවේ සිංහල ජනතාව අතර ප්‍රචලිතව පවතින්නකි.

මෙම කිරි අම්මාවරු වූ කලී වැදි ජනයා අදහන මිය ගිය නෑ යකුන් ලෙස සැලකේ. එවැනි කිරි අම්මාවරු රැසක් ඌවේ ජනාදරයට පත්ව සිටිති. ඒ මෙසේය;

1. ඉඳිගොල්ලේ කිරි අම්මා
2. කුකුළාපොළ කිරි අම්මා
3. උනාපාන කිරි අම්මා
4. වෙල්ලස්සේ කිරි අම්මා
5. කොස්ගම කිරි අම්මා
6. බිළිඳු කිරි අම්මා
7. කොට වැව කිරි අම්මා
8. මහ කිරි අම්මා
9. ඉඳිගස්වෙල කිරි අම්මා
10. පොල්ගහගම කිරි අම්මා
11. කොලොන්වින්නේ කිරි අම්මා
12. ගෝන තලාවේ කිරි අම්මා
13. ඉහබේ කිරි අම්මා
14. ඉනාවැල්ලේ කිරි අම්මා
15. දොඹගහවෙල කිරි අම්මා
16. කපුයායේ කිරි අම්මා
17. මිරිය බැද්දේ කිරි අම්මා
18. පුස්පාරග කිරි අම්මා
19. බෝවල ගෙදර කිරි අම්මා
20. බාල ගිරි කිරි අම්මා
21. මැදගංගොඩ කිරි අම්මා
22. තල්කොට කිරි අම්මා
23. දඹගල්ලේ කිරි අම්මා
24. හඳුන් කුමාරී කිරි අම්මා

වැදි ජනයා අතර ප්‍රසිද්ධ කුකුළාපොළ කිරිඅම්මා ලෙස සැලකෙන්නේ යක්ෂ ගෝත්‍රික කුවේණියයි. උනාපානේ කිරිඅම්මා වූ කලී එම වර්ගයේ ආදි කන්තාවයි. කොස්ගම දෙවියන්ගේ බිරිඳ කොස්ගම කිරිඅම්මා විය(ධර්මදාස සහ තුන්දෙණිය,1994:201-202).

ඌවේ ජනයා කිරිඅම්මාවරුන් සමඟ පත්තිනි දේවිය සම්බන්ධ කරගෙන ඇත. හළඹ කුමාරි අම්මා සහ හඳුන්කුමාරි අම්මා ලෙස පත්තිනි දෙවියන් හඳුන්වනු ලබන්නේ එබැවිනි. රිද්දි යාගයේදී රිද්දි බිසව් සත් දෙනාද වැදිජන විශ්වාසයේ ඇති කිරි අම්මලා සමඟ සම්බන්ධවේ(ධර්මදාස සහ තුන්දෙණිය,1994:201-202).

## ඌවට ආවේණික ශාන්තිකර්ම

ඌවට ආවේණික ශාන්තිකර්ම කිහිපයක් දැකිය හැකිය. ඒ අතර කිරිඅම්මා දානය, හත්පෝරුව, රාළහාමි පිදීම විශේෂත්වයක් දරයි.

## කිරිඅම්මා දානය

ඌවේ ජනයා අතර ප්‍රකට කිරිඅම්මා දේව සංකල්පය මොනරාගල ප්‍රදේශයේ පවතී. කිරි අම්මා ශාන්තිකර්මය මුළු රැයක් පුරා සිදු කෙරෙන්නකි. මෙහිදී මහ කිරිඅම්මාට සේවය සඳහා හතර කට්ටුවක් සිටී. මෙයින් මහ කිරිඅම්මාගේ තේජස් බලය විදහා දක්වේ. සිංහල බෞද්ධයන් අතර ප්‍රචලිත කිරි අම්මා දානය සත්පත්තිනිය මුල් කරගෙන සිදු කරන්නකි. ඌවේ කිරි අම්මා දානය යක්ෂ, ප්‍රේත, භූත, කුම්භාණ්ඩයන්ගෙන් තම පවුලට පැමිණෙන අපල උපද්‍රව දුරු වීමටත් කුඩා දරුවන්ගේ රෝග පීඩාදිය වැළැක්වීමටත් සිදු කරනු ලබන්නකි.

වන්නියේ බණ්ඩාර කිරි අම්මා සහ දොළහ බණ්ඩාර කිරි අම්මා වෙනුවෙන් කිරි මව්වරු හත් දෙනෙක් යොදා ගනිමින් බදාදා හෝ සෙනසුරාදා දිනකදී මෙම දානය පිරිනැමේ. කැවුම්, කිරිබත්, හත්මාළු, තල, මුං අළුවා ඇතුළු අඩුක්කුව නොයිඳුල්ව පුදන මෙම පූජාවේදී සත් පත්තිනි දෙවියන් උදෙසා පහන් දල්වා කන්නලව් කියා අවසන කිරි අම්මා දානයේ අපේක්ෂාව කියා සිටී. අනතුරුව කෙසෙල් කොළයට බෙදන කිරි දානයෙන් කොටසක් අනුභව කොට ඉතිරිය සුදු පිරුවටින් ඔතා කිරි අම්මාවරු රැගෙන යති. පත්තිනි දේව ඇදහිල්ල හා සම්බන්ධ යක්ෂ ගෝත්‍රික කිරි මව්වරුන් මුල්කොට සිදු කෙරෙන යථෝක්ත කිරි අම්මා දානය ඌවට ආවේණිකත්වයක් දරයි (පියසේන,1991:201).

## හත්පෝරුව ශාන්තිකර්මය

පත්තිනි දේවිය වෙනුවෙන්ම සිදුකරන හත්පෝරුව ශාන්තිකර්මය ඌවේ ජනතාව අතර ප්‍රචලිතව පවතී. ඌවේ පන්නවෙල, දියපොල, උඩපෝරුව, වැලි උල්ල, තිරුවාන ගම හා බඹරපාන ආදී ගම් ආශ්‍රිතව වාර්ෂිකව පැවැත්වෙන හත්පෝරු මංගල්ලය පැරණි දේවාලයක් මුල් කොටගෙන සිදු කරන්නකි. පත්තිනි කිරිඅම්මා දෙවියන් උදෙසා දින 7ක් තිස්සේ මහා දේව මංගල්ලයක් සිදුකෙරේ. එය කතරගම පෙරහැර පවත්වා දින 14කින් ආරම්භ කිරීම චිරාගත පිළිවෙතයි (පියසේන,1991:215).

## රාළහාමි පිදීමේ ශාන්තිකර්මය

ඌවට විශේෂිත වූ පූජාකර්මයක් ලෙසට රාළහාමි පිදීමේ ශාන්තිකර්මය හැඳින්විය හැකිය. කෘෂිකර්මාන්තයට මහෝපකාරී වන ගවමහීෂාදීන්ගේ ආරක්ෂාව පිණිස මෙය සිදුකරනු ලබයි. පූජා විධි රටාව, පරමාර්ථ හා ඉතිහාස කතාව අනුව කොස්ගම දෙවියන් හෙවත් කුඩායකු ශාන්තිකර්මයට මෙය සමාන වේ. ඒ අනුව ඌවේ රාළහාමි පිදීමේ ශාන්තිකර්මය යනු කොස්ගම දේවියන්ගේ කංකාරිය ලෙසට තහවුරු වේ. එසේම ඌවේ පුදලබන කොස්ගම කිරිඅම්මාගේ ස්වාමියා කොස්ගම දෙවියන් ලෙසට ද ප්‍රසිද්ධය.

පෘතුගීසි සමයේදී සිංහල හමුදාවට විරුද්ධ පෘතුගීසි හමුදාවේ සිටි සෙන්පතියකු වූ සීමන් කුරේ රාළ කොස්ගම දෙවි නමින් ප්‍රසිද්ධ වූ බවට මතයකි. එමෙන්ම ඌවේ බිබිල

ප්‍රදේශයේ සිටි කොස්ගම වන්නියා නම් වැදි නායකයා මරණින් මතු කොස්ගම දෙවියන් බවට පත්වූ බවත් ඔහුගේ අනර්ථකාරී ස්වරූපය නිසා කුඩායකු නමින් හැඳින්වූ බවටත් සාක්ෂි වේ.

විභාවි විජයශ්‍රීවර්ධනයන් ඉදිරිපත් කරන කොස්ගම දේව කංකාරියේ පූජා චාරිත්‍ර (විජය ශ්‍රී වර්ධන,1996:39-47) හා ඌවේ රාළහාමි පිදීමේ ශාන්තිකර්මයේ පූජා චාරිත්‍ර (පියසේන,1991:198) සැසඳීමේදී සුළු වෙනස්කම පැවැතියද අරමුණු හා පරමාර්ථ මඟින් ඌවේ රාළහාමි පිදීමේ පූජාකර්මයට කොස්ගම දේව කංකාරියේ පූජා චාරිත්‍ර සමාන බවක් පෙන්වයි. එසේ වුවත් ඌවට ආවේණික යක්ෂ සම්බන්ධය රාළහාමි පිදීමේ ශාන්තිකර්මය තුළ දෘශ්‍යමාන වීම විශේෂත්වයකි.

## නිගමනය

පූර්වෝක්ත තොරතුරු අනුව ඌවට ආවේණික දේව සංකල්ප හඳුනාගත හැකි අතර එහිදී අනාවරණය වන්නේ ලක්දිව ප්‍රචලිත ප්‍රධාන දේව ඇදහිලි කිහිපයක්ම ඌවේ ප්‍රභවය වී ඇති බවයි. එමෙන්ම යක්ෂ ගෝත්‍රික පුද පිළිවෙත් සමඟ බද්ධ වූ ඌවේ පත්තිනි දේව ඇදහිල්ල ඌවටම ආවේණික ලක්ෂණයන්ගෙන් ප්‍රතිනිර්මාණය වී ඇති අයුරු පැහැදිලි වේ. ඌවේ බණ්ඩාර දේව සංකල්පය අතිශයින් සංකීර්ණ මෙන්ම ගැටලු සහගත තත්ත්වයක් ඇති කිරීමට සමත් වූවකි. පෙරද සඳහන් කළ පරිදි බොහොමයක් බණ්ඩාර දෙවිවරු ඌවේ අනුස්මරණීය ජන නායකයෝ වෙති. ඔවුහු විවිධ සමාජ-දේශපාලන අවුල්-වියවුල් හේතුවෙන් මරණයට පත්ව පසුව දේවත්වය ලැබූවෝ වෙති. මෙය ඌවේ වැදි ජන සංස්කෘතියේ නෑ යකුන් පිදීමේ සංකල්පයට බද්ධ වන බව කිවයුතුය. එබැවින් ඌවේ දේව ඇදහිල්ල ඌවටම ආවේණික ලක්ෂණවලින් සමන්විත වන අතර ඒ සඳහා ඌවේ ඓතිහාසික හා දේශපාලන ප්‍රවණතා ඉවහල් වී ඇති බව කිව යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

පියනන්ද හිමි, හේන්පිටගෙදර, 1954, කහකුරුළු සංදේශය, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

බණ්ඩාර, ස.ජ. සුමනසේකර, 1993, කඳකුමාර සිරිත, පාදුක්ක: ස්ටේට් ප්‍රින්ටින් කෝපරේෂන්.

සන්නස්ගල, පුංචිබණ්ඩාර, 1973, සොරගුණේ දේවාල පුවත, සොරගුණේ: ඒ. එල්. එම්. අබේරත්න බණ්ඩාර ප්‍රකාශකයෝ.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ, 1966, ඌව ඉතිහාසය, කොළඹ: එම්. ඩී ගුණසේන සහ සමාගම.

මහාවංශය (ඌන පූරණ සහිත), 1959, සංස්, ඒ. පී. බුද්ධදත්ත හිමි, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

Rahula Ven, Walpola ,1966, Early history of Buddhism in Ceylon, Colombo: M. D. Gunasena and Company.

Paranawithana, Senarath,1953, The shrine of Upulvan at Devundara, Colombo: the Ceylon government Archaeological Department.

ධර්මදාස, කේ. එන්. ඕ. තුන්දෙණිය, එච්. එම්. එස්. 1994, සිංහල දේව පුරාණය, පාදුක්ක: රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

සීලප්පදිකාරම් දෙමළ මහා කාව්‍යය, 1996, පරි, එම්. එච්. පීටර් සිල්වා, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

චන්ද්‍රජෝති හිමි, මාපොටේ; විපුලසාර හිමි, ගොඩගම, 1954, ලාංකික දෙවිවරු, ඇහැලියගොඩ: ගුණතිලක මුද්‍රණාලය.

පූජාවලිය, 1997, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ගුණසේන සහ සමාගම.

මඟ සලකුණ, 1947, සංස්, පූජ්‍ය එඩ්මන්ඩ් පීරිස් සහ එම් ඊ ෆර්ඩිනෑන්ඩු, කොළඹ: සිලෝන් ප්‍රින්ටර්ස්.

ධඉිැන්ර්ල ය්බ්බ්එය්ල 1984ල ඔයෑ ක්මකඑ දෙ ඨදිා ඡ්එඑසබසල ඎසසජ්ටදඅ ඎසසජ්ටද ඹබසඬැරිසඑහ ඡරෑග

හංස සංදේශය, 1964, සංස්, රත්මලානේ ශ්‍රී ධර්මකීර්ති හිමි, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

කරුණානන්ද, උක්කුබණ්ඩා, 1990, නුවරකලාවිය 1815-1900, කැළණිය: සීලා ප්‍රින්ටර්ස්.

ෟැඩ්ර්ව්ල බගීග1972ල ඔයෑ ණ්බාහ්බ ණසබාදප 1707-1760ල ඤකදපඉදඅ බ්නෑ ්‍යදමෑ ෂබඞ්ැඑපැබඞීග

වාචීස්සර හිමි, කොටගම, 1964, සරණංකර සංඝරාජ සමය, කොළඹ: වයි දොන් ඇඩ්වින් සහ සමාගම.

හේරත්, අත්තනායක, එම්. සහ තවත් අය, 1991, "ඌවේ සම්භාවනීය ජීවිත", ඌව වංශකතාව දෙවන කාණ්ඩය, සංස්, වි. වා. මු. තිලකසිරි සහ තවත් අය, බදුල්ල: ඌව පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යංශය.

මීගස්කුඹුර, පුංචිබණ්ඩාර, 1991, "ඌවේ වැදි ජන පුරාණය", ඌව වංශකතාව දෙවන කාණ්ඩය, සංස්, වි. වා. මු. තිලකසිරි සහ තවත් අය, බදුල්ල: ඌව පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යංශය.

පියසේන, ධර්මසිරි, 1991, "ඌවේ ජන ඇදහිලි හා විශ්වාස", ඌව වංශකතාව දෙවන කාණ්ඩය, සංස්, වි. වා. මු. තිලකසිරි සහ තවත් අය, බදුල්ල: ඌව පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යංශය.

Seligmann,C.G.and Seligmann B, 1911, The veddas, Cambridge: Cambridge University press.

විජයශ්‍රීවර්ධන, විහාවී, 1996, සිංහල රණවිරු දෙවිවරු, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සද්ධර්මාලංකාරය, 1954, සංස්, පූජ්‍ය කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

සෙලිග්මාන්, සී. ජී. සෙලිග්මාන්, එම්. ඩී. බී. 2009, වැද්දෝ, පරි, චන්ද්‍ර ශ්‍රී රණසිංහ, කොළඹ: ෆාස්ට් පබ්ලිකේෂන් ප්‍රයිවට් ලිමිටඩ්.

White, Harbat, 1985, Manual of the Province of Uva, Colombo.